කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය-
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

## <u>භාවිතයෙන් ඉවත් කරන ලද වාහන විකිණීම සඳහා මිල ගණන් කැඳවීම.</u>

1. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් භාවිතයෙන් ඉවත් කරන ලද මෝටර් වාහන, ඉඩම් වාහන, බර වාහන, මෝටර් සයිකල්,ටෙන්ඩර් මගින් අපහරණය කිරීම සඳහා මිල ගණන් භාරගැනීම සිදු කෙරේ. ඒ අනුව මහවැලි අධිකාරියේ **<u>කොළඹ - ප්‍රධාන කාර්යාලය , බී කලාපය - වැලිකන්ද, සී කලාපය - දෙහිඅත්තකණ්ඩිය (තෝඩ ගොවිපල, රත්කිඳ ගොවිපල), වික්ටෝරියා / ඊ කලාපය - දිගන, එච් කලාපය - (නිරාවිය ගොවිපල/ යාන්ත්‍රික වැඩපල - තඹුත්තේගම), වලව කලාපය - ඇඹිලිපිටිය, එල් කලාපය - වැලිඔය, මහවැලි ආරක්ෂක බලකාය - දිගන, රඹකැන්ඔය කලාපය- මහඔය, මොරගහකන්ද කලාපය - (යාන්ත්‍රික වැඩපල - බකමූණ) හා ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය - (දිගන)</u>** යන ස්ථානයන්හි දී මෙම වාහන, 2026.07.17 දින සිට 2026.08.06 දින දක්වා පෙ.ව.9.30 සිට ප.ව. 3.00 තෙක් (රජයේ නිවාඩු දිනයන් සහ සති අන්ත දිනයන් හැර) පරික්ෂා කර බැලිය හැකිය.
2. අයදුම්කරුවෙකුට එක් වාහනයක් හෝ වාහන කිහිපයකට අයදුම් කළ හැකිය.
3. මේ සඳහා අයදුම් පත්‍රයක් මිල දී ගෙන ඉල්ලුම් කරන වාහන සඳහා වෙන් වෙන් වශයෙන් මිල ගණන් ඉදිරිපත් කල යුතුය.
4. අදාළ අයදුම්පත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ 07 වන මහලේ මුදල් අංශයේ ගණකාධිකාරි(වත්කම්/ගබඩා) වෙතින් හෝ ඉහත 01 හි දක්වා ඇති කලාප/අංශ කාර්යාලවල ගණකාධිකාරී / ගිණුම් නිලධාරි වෙතින් රු. 3500/- ක ආපසු නොගෙවන තැන්පත් මුදලක් ගෙවා 2026.07.17 දින සිට 2026.08.06 දින දක්වා පෙ.ව. 9.30 සිට ප.ව. 3.00 තෙක් ලබාගත හැකිය. (රජයේ නිවාඩු දිනයන් සහ සති අන්ත දිනයන් හැර)
5. ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සමඟ එම වටිනාකමින් 5% කට සමාන මුදලක් <u>ආපසු ගෙවන</u> ඇප තැන්පතුවක් ලෙස ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. මිල ගණන් ඉදිරිපත් කරනු ලබන වාහන සඳහා අදාලව ආපසු ගෙවනු ලබන තැම්පතු මුදල බැංකු අණකරයක් හෝ මුදල් තැම්පතුවක් ලෙස අයදුම්පත් සමග ඉදිරිපත් කල යුතුය.
6. ඔබගේ මිල ගණන් සහිත අයදුම්පත් යොමු කිරීමේදී, ලියුම් කවරය වම්පස කෙලවර “භාවිතයෙන් ඉවත් කරන ලද වාහන සඳහා මිල ගණන් කැඳවීම” ලෙස මිල ගණන් ඉදිරිපත් කල යුතු අතර මිල ගණන් සහිත අයදුම්පත් ඇප තැම්පතුවද සමඟ 2026.08.07 දින පෙ.ව.11.00 ට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය, ප්‍රසම්පාදන අංශය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටි.බී.ජයා මාවත, කොළඹ 10 යන ලිපිනයෙහි 09 වන මහලේ ප්‍රසම්පාදන අංශයේ පිහිටි ටෙන්ඩර් පෙට්ටියට ලියාපදිංචි තැපැල මගින් එවීමට හෝ පැමිණ භාර දීමට කටයුතු කල යුතුය. 2026.08.07 දින පෙ.ව. 11.00 ට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
7. සෑම අයදුම්පත්‍රයක් සමගම අපහරණය කරනු ලබන වාහන පිළිබඳ විස්තරයක් සපයනු ලැබේ.
8. මිට්සුබිෂි J-44 ජීප්, මිට්සුබිෂි පැජරෝ, ටොයෝටා ලෑන්ඩ්ක්‍රෑෂර් යන වර්ගවල ජීප් රථ, මයික්‍රෝ ටොයෝටා, නිසාන් ඩබල් කැබ් රථ, මහෙන්ද්‍රා ට්‍රැක්ටර්, ටාටා ලොරි, ටොයෝටා කාර්, මෝටර් බයිසිකල් අපහරණය කරනු ලබන වාහනවලට අයත් වේ.
9. අයදුම්පත් හා ලේඛන මහවැලි වෙබ් පිටුව www.mahaweli.gov.lk වෙත පිවිස පරික්ෂා කල හැක.
10. වැඩිදුර තොරතුරු සඳහා, ගණකාධිකාරි (වත්කම් හා ගබඩා) මුදල් අංශය දු. ක. 011 2687497 අමතා ලබා ගත හැක.

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.
අංක 500, ටී.බී. ජයා මාවත,
කොළඹ 10.